කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT 2022

සිරකරු සුභසාධක අරමුදල

சிறைக்கைதிகள் நலனோம்பல் நிதியம்

PRISONERS WELFARE FUND



බන්ධනාගාර දෙපාර්තමේන්තුව

சிறைச்சாலைகள் திணைக்களம்

DEPARTMENT OF PRISONS

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT

2022

සිරකරු සුභසාධක අරමුදල

சிறைக்கைதிகள் நலனோம்பல் நிதியம்

PRISONERS WELFARE FUND

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

சிறைச்சாலைகள் திணைக்களம்

DEPARTMENT OF PRISONS

පටුන

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

අරමුදලේ නම - සිරකරු සුභසාධක අරමුදල

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - අරමුදලේ පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1 - 2
පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම	3 - 8
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	9 - 15
පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක	16
පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	17
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	18
පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව	19 - 24

ඇමුණුම

සිරකරු සුභසාධක අරමුදල් පනත	27 - 33

1.1. හැඳින්වීම

බන්ධනාගාර ආයතනයන් තුල සිරකරුවන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ කර්තවයේදී ඒ වෙනුවෙන් පවත්වනු ලබනආධ්‍යාත්මික, අධ්‍යාපන, ක්‍රීඩා හා පශ්චාත්භාර කටයුතු ආදි වැඩසටහන් වෙනුවෙන් අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදන ලබාදෙන ප්‍රධාන අරමුදල වශයෙන් සිරකරු සුභසාධක අරමුදල හැදින්විය හැකිය.

1.2. අරමුදල පිහිටුවා ඇති නෛතික රාමුව

1973 අංක 18 දරණ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුභසාධක අරමුදල් පනත (අමුණා ඇත)

1.3. අරමුදලේ පරමාර්ථ

1. රැඳවියන් පුනරුත්ථාපනය කිරිම වෙනුවෙන් ශක්තියක් ලබාදීම.
2. රැඳවියන් පුනරුත්ථාපනය කිරිම වෙනුවෙන් පවත්වන වැඩසටහන් සඳහා මූල්‍යමය ආධාරයක් ලබාදීම.
3. කාලීන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත කිරිම.

1.4. අරමුදලේ දැක්ම, මෙහෙවර, අරමුණ

දැක්ම

නේවාසිකයින් පුනරුත්ථාපනය තුලින් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරිම.

මෙහෙවර

නේවාසිකයින්ගේ සුභසාධක කටයුතු විධිමත් කිරිම තුලින් ඔවුන්ගේ ශ්‍රම ඵලදායිත්වය රටට වැඩදායි ලෙස යොදා ගැනීම.

අරමුණ

බන්ධනාගාර නේවාසිකයින් විධිමත් පුනරුත්ථාපනය කිරිම මගින් නීති ගරුක මානව හිතවාදි පුද්ගලයන් බවට පත්කර ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි කිරිමට දායක විම.

1.5. ප්‍රධාන කාර්යයන්

1. ආධ්‍යාත්මික හා ආගමික කටයුතු වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබාදිම.
2. අධ්‍යාපන හා සුභසාධන කටයුතු වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබාදිම.
3. සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබාදිම.
4. සිරකරුවන්ට ත්‍යාගදීම කටයුතු වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබාදිම.
5. සිරකරුවන්ගේ පශ්චාත් භාර සේවා කටයුතු වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන ලබාදිම.

1.6. **සංවිධාන සටහන** - මෙම අරමුදලට අදාල නොවේ.

1.7. **විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)** - නැත

අ) ව්‍යාපෘතියේ නම

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි.

ඈ) ව්‍යාපෘති කාල සීමාව

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක කෙටියෙන් පැහැදිලි කරන්න
(අරමුදලේ සභාපති විසින් අත්සන් කළ යුතුය.)

ජයග්‍රහණ

- සියළුම බන්ධනාගාර ආයතන වල රැඳවියන්ගේ ආධ්‍යාත්මික, අධ්‍යාපන, ක්‍රීඩා හා පශ්චාත් හාර සේවා යන අංශයන් සංවර්ධනය සඳහා විධිමත් සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් බන්ධනාගාර ආයතන වල රඳවා සිටින නේවාසිකයින් යහපත් පුනරුත්ථාපන ක්‍රියාවලියකට නතුකර ගැනීමට හැකි වීම.

- මෙම පුනරුත්ථාපන කාර්යයන් තුල අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව හා ආධ්‍යාත්මික සංවර්ධනයක් සිරකරුවන් තුල ඇති කිරීම තුළ ඔවුන් සමාජගත වීමෙන් පසුලද අත්දැකීමෙන් යහපත් පුරවැසියෙකු ලෙස ජීවත් වීම.

අභියෝග

- සිරකරු පුනරුත්ථාපනය වෙනුවෙන් පවත්වන වැඩසටහන් සඳහා මූල්‍යමය වශයෙන් ප්‍රතිපාදන ලබාදෙන එකම වැය ශීර්ෂය සිරකරු සුභසාධක අරමුදලයි. නමුත් මෙහි පවතින්නේ අවම ශේෂයක් බැවින් සිරකරු පුනරුත්ථාපන වැඩසටහන් සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

ඉදිරි ඉලක්ක

- සිරකරු සුභසාධක අරමුදල සඳහා වාර්ෂික ආදායමේශේෂය වැඩි කිරීමට කටයුතු සංවිධානය කිරීම
- නිදහස් වන වෘත්තීය පුහුණුව ලද නේවාසිකයින් සඳහා වෘත්තීය උපකරණ කට්ටල ලබාදීම.
- සමාජයට වැඩදායි පුද්ගලයින් පිරිසක් සමාජගත කිරීම.

එච්.එම්.ටී.එන්. උපුල්දෙණිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

සිදුකරන ලද පුනරුත්ථාපන වැඩසටහන්

01. අධ්‍යාත්මික හා ආගමික කටයුතු

පසළොස්වක පෙහොය දින වලදි පැවැත්වෙන ශීල වයාපාර ධර්ම දේශනා, භාවනා වැඩසටහන් ඇතුළු සියලුම බෞද්ධ වැඩසටහන්, හින්දු ආගමික කටයුතු, මුස්ලිම් ආගමික කටයුතු, කතෝලික ආගමික කටයුතු, මානසික සංවර්ධන හා උපදේශන වැඩසටහන්







2. අධ්‍යාපන හා සුභසාධක කටයුතු

නොවිධිමත්/විධිමත් අධ්‍යාපන වැඩසටහන්, වෘත්තීය පුහුණු කටයුතු, පුස්තකාල කටයුතු, දහම් අධ්‍යාපනය, සංස්කෘතික කටයුතු, සෞඛය වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර වැඩසටහන්, නේවාසික පවුල් හමුව, නීති ආධාර වැඩසටහන් ආදිය නේවාසිකයින් වෙනුවෙන් පවත්වන ලදී.



නේවාසිකයින් සඳහා අධ්‍යාපන පංති පැවැත්වීම



නේවාසිකයින්ගේ මානසික සුවය හා සංවර්ධනය උදෙසා පොත් කියවීම.



නේවාසිකයින් සඳහා පවුල් හමුව පැවැත්වීම







නීති ආධාර වැඩසටහන

නේවාසික බාලදක්ෂ කණ්ඩායම





නේවාසික නැටුම් කණ්ඩායම



නේවාසිකයින් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම



නේවාසිකයින් යහවිනෝද හාණ්ඩ නිෂ්පාදනය කිරීම

3. ක්‍රීඩා හා වෙනත්

බන්ධනාගාර ආයතන තුල පැවැත් වූ දෛනික ක්‍රීඩා කටයුතු, අන්තර් බන්ධනාගාර තරග, බාලදක්ෂ ආදී වැඩසටහන්



දෛනික ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම

ක්‍රීඩා තරග පැවැත්වීම



4. විශේෂ දක්ෂතා දක්වන නේවාසිකයින්ට ත්‍යාග ලබාදීම.





3.1 රාජ්‍ය අංශය සඳහා වන ගිණුම්කරණ ප්‍රමිති අංක 01 මගින් නියම කර ඇති ආකෘතියට අනුව පිළියෙල කර ඇති මුල්‍ය ප්‍රකාශන මෙය යටතේ ඇතුලත් කරයි.

3.2 වෙන් කරන ලද ප්‍රතිපාදන (පවතී නම්) උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	2,000,000.00		1,666,709.00	94.0%
ප්‍රාග්ධන			213,483.00	

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය - පරිත්‍යාග වශයෙන් මුදල් ලැබී නොමැත.

පරිත්‍යාගය කල ආයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල
-	-	-

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය - මෙම අරමුදල සඳහා අදාල නොවේ.

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ජේඑල්ඕ/සී/ඩී/ඩීඊපී/එෆ්ඩී/2022 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 29 දින

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
සිරකරු සුභසාධක අරමුදල

බන්ධනාගාර සිරකරු සුභසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බන්ධනාගාර සිරකරු සුභසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව, සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) බන්ධනාගාර ආයතන වෙත ලැබෙන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.7,860,139 ක පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ලැබීම් හා තොග මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව අරමුදලේ ජංගම නොවන වත්කම් දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරමින් 2021 වර්ෂයේ දී 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කර තිබුණු අතර එදිනට නොමිලේ වත්කම් ප්‍රදාන ගිණුමේ රු.24,350,099 ක ශේෂය වත්කම් ඉවත් කිරීමේ ගිණුම තුලින් ගැලපීම නිසා ජංගම නොවන වත්කම්වලට අදාළව රු.12,640,730 ක ඉවත් කිරීමේ අතිරික්තයක් නිරූපනය විය. මෙම අතිරික්තය 2022 දෙසැම්බර් 31 දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිතවල ඇතුළත් වී ඇත තවද 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කළ දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ මෙම වත්කම්වල වටිනාකම රු.2,371,275 ක් වශයෙන් වාර්තා කර තිබුණ ද මෙම වත්කම් භෞතිකව නිශ්චිතව හඳුනාගෙන ගිණුම් පොත්වල වාර්තා කල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ 1.2 දක්වා ඇති නිරීක්ෂණ හා ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති රීති රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
	(i) 237	ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේ දී ගෙවීම් වවුචරයේ භාණ්ඩ ලැබී ඇති බවට හා අදාළ බඩු ලේඛනයේ තොග පොත්පත් යනාදියේ එකී භාණ්ඩ ඇතුළත් කර ඇති බවට සහතිකයක් අමුණා තිබිය යුතුය. නමුත් වැලිකඩ, බූස්ස හා වටරැක බන්ධනාගාරවල සිරකරු සුභසාධක අරමුදලින් මිලදී ගත් රු.205,002 ක භාණ්ඩ තොගපොත්වල ඇතුළත් කර නොතිබූ අතර ගෙවීම් වවුචර් වලද අදාළ ද්‍රව්‍ය ලැබුණු බවට සටහන් ඇතුළත් වී නොතිබුණි.
	(ii) 877 (2) (අ)	අරමුදල සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වා නොමැති අතර සුභසාධක අරමුදලේ ගණුදෙනු දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුම යටතේ ඉටුකරගෙන තිබුණි.

3.2. කළමනාකරණ ක්‍රියාකාරකම්

අරමුදලේ ප්‍රගතිය මැනීම සඳහා කාර්යසාධන දර්ශක හඳුන්වා දී නොතිබූ අතර බන්ධනාගාරවල පැවැත්විය යුතු වැඩසටහන්වල ස්වභාවය, සහභාගී කළ යුතු සිර/ සැකකරුවන් සංඛ්‍යාව, දැරීමට සිදුවන පිරිවැය ඇතුළත්ව පූර්ව සැලසුම් සකස්කර එම සැලැස්මවලට අනුව ප්‍රගතිය වාර්තා නොකිරීම නිසා අරමුදලේ අරමුණු ඉටුකිරීමේ මූල්‍ය හා භෞතික කාර්යසාධනය ඇගයීමට නොහැකි විය.

3.3. අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ අයවැය මඟින් සිරකරු සුභසාධනය සඳහා රුපියල් මිලියන දෙකක් වෙන් කර තිබුණද එම මුදල් ප්‍රමාණවත් නොවීම නිසා දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයෙන් වැය විෂයයන් 03 ක් යටතේ රු.2,377,848,334 ක මුදලක් වැය කර තිබුණු අතර අරමුදලේ ඇස්තමේන්තු ගත ලැබීම් ප්‍රමාණය රු.1,437,250 ක් වුවද සත්‍ය ලැබීම් ප්‍රමාණය රු.2,651,796 ක් වූයෙන් අයවැය ගත ලැබීම් ප්‍රමාණයට වඩා සත්‍ය ලැබීම ප්‍රමාණය රු.1,214,546 ක් එනම් සියයට 84.5 කින් වැඩි තිබුණි. තවද අරමුදලේ ලැබීම් ශීර්ෂ 10 ක් අතුරින් ලැබීම් ශීර්ෂ 07 කම අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර වෙනස සියයට 100 සිට සියයට 4,063 ක් දක්වා පරාසයක් තුළ විචලනය වූ බැවින් අයවැය ඇස්තමේන්තුව තාත්විකව සකස් කර පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

4.1 අරමුදලේ කාර්ය සාධන දර්ශක - 2022 (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
නේවාසකයින් අධ්‍යාත්මික හා ආගමික වැඩ සටහන් සඳහා යොමු කිරීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශතය		89.0%	
නේවාසිකයින්ගේ අධ්‍යාපන හා සුභසාධන කටයුතු වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශය	100%		
නේවාසිකයින්ගේ ක්‍රීඩාකුසලතා වැඩිදියුණු කිරීම හා වෙනත් පහසුකම් ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශතය	94.7 %		
විවිධ කුසලතා සහිත නේවාසිකයින් වෙනුවෙන් ඔවුන්ගේ දක්ෂතා අගයනු වස් ත්‍යාග පිරිනැමීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රතිශතය		83.1%	
නේවාසිකයින්ගේ පශ්චාත්භාර සේවා කටයුතු වෙනුවෙන් වන ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රතිශතය			72.5%

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න. මෙම අරමුදල සඳහා අදාල නොවේ.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	**50%-74%**	**75%- 100%**

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - මෙය පෘජුවම අදාල නොවන අතර, මෙම අරමුදල සඳහා වෙනම සේවක සංඛ්‍යාවක් නොමැත. දෙපාර්තමේන්තුවේ නිලධාරින්ම මෙහි කටයුතු කරන බැවින් නිලධාරි පුරප්පාඩු නොමැත.

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ			
තෘතීයික			
ද්විතියික			
ප්‍රාථමික			
කොන්ත්‍රාත්/ අනියම්			

06.2 **අරමුදලේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න. - අදාල නොවේ.

06.3මානව සම්පත් සංවර්ධනය -මෙම අරමුදල සඳහා අදාල නොවේ.

වැඩසටහනේ නම	පුහුණු කරනලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය **(Rs'000)**		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. - අදාල නොවේ.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	-		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	-		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	-		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතලපවරාදී තිබීම	-		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	-		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	-		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම	-		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	-		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	-		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	-		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	-		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	-		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	-		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	-		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAවක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	-		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	-		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරනිබීම	-		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	-		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	-		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	-		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	-		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	-		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	-		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	-		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	-		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	-		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	-		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	-		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	-		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	-		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	-		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	-		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	-		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	-		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	-		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	-		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	-		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම	-		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	-		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	-		

අැමුණුම



ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත

[සභාතිකය පටහත් කළේ 1973 මැයි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

(උ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන විකුණුම් කාමරයෙන්,

(ii) සිරකරුවන් විසින් සාදන ලද විනෝදාංශ ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීමෙන්, සහ

(iii) බන්ධනාගාරයෙහි පවත්වාගෙන යනු ලබන ආපන ශාලාවලින්

ලැබෙන ශුද්ධ ලාභ; සහ

(ඒ) මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබිය හැකි, අරමුදලට ලැබෙන වෙනත් ආදායම් මුදල්.

අරමුදලේ මුදල් වියදම් කිරීම.

5. අරමුදලේ බැරට ඇති මුදල්, ලේකම් විසින් කලින් කල නිකුත් කරනු ලබන උපදෙස්වලට යටත්ව පහත සඳහන් කාර්යයන්ගෙන් යමක් සඳහා වියදම් කිරීමට බන්ධනාගාර කොමසාරිස් වරයාට බලය ඇත්තේ ය:—

(අ) සිරකරුවන්ගේ අධ්‍යාත්මික සහ ආගමික ශුභ සිද්ධිය;

(ආ) සිරකරුවන්ගේ අධ්‍යාපනික ශුභ සිද්ධිය;

(ඇ) සිරකරුවන් සඳහා විනෝද ක්‍රීඩා පහසුකම් සහ වෙනත් සැප පහසුකම් සැලැස්වීම;

(ඈ) සිරකරුවන්ට තෑගි දීම;

(ඉ) ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ සිරකරුවන් සඳහා ආපන ශාලා පවත්වාගෙන යාම පිණිස, ආපසු ගෙවිය හැකි අත්තිකාරම් ගෙවීම.

(ඊ) →

මුදල් වර්ෂය.

6. අරමුදලේ කාර්යයන් සඳහා වූ මුදල් වර්ෂය ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ ව දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය වන්නේ ය.

ගණන් තබා වාර්තාකරණය.

7. (1) අරමුදලේ ගණන් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය.

(2) එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අරමුදලේ කටයුතු සිදු වූ ආකාරය දක්වන්නා වූ ද අරමුදලේ කටයුතුවලට සම්බන්ධ සියලු ගණුදෙනුවල පූර්ණ විස්තර අඩංගු වූ ද පූර්ණ ප්‍රකාශයක් බන්ධනාගාර කොමසාරිස්වරයා විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ද සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් හැකි පහසුම ඉක්මණින් එකී වාර්තාව ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

අර්ථ විවරණය.

8. මේ පනතෙහි "ලේකම්" යන්නෙන් බන්ධනාගාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ.

2 ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත

(ඌ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් [illegible] යනු ලබන විකුණුම් කාමරයෙන්,

(ii) සිරකරුවන් විසින් සාදන ලද විනෝදාංශ [illegible] ප්‍රදර්ශනය කිරීමෙන්, සහ

(iii) බන්ධනාගාරයෙහි පවත්වාගෙන යනු ලබන ආපන ශාලාවලින්

ලැබෙන ශුද්ධ ලාභ ; සහ

(එ) මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබිය හැකි, අරමුදලට ලැබෙන වෙනත් ආධාර මුදල්.

අරමුදලින් මුදල් වියදම් කිරීම.

5. අරමුදලේ බැරට ඇති මුදල්, ලේකම් විසින් කලින් කල නිකුත් කරනු ලබන උපදෙස්වලට යටත්ව පහත සඳහන් කාර්ය යන්ගෙන් යමක් සඳහා වියදම් කිරීමට බන්ධනාගාර කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය :—

(අ) සිරකරුවන්ගේ අධ්‍යාත්මික සහ ආගමික ශුභ සිද්ධිය ;

(ආ) සිරකරුවන්ගේ අධ්‍යාපනික ශුභ සිද්ධිය ;

(ඇ) සිරකරුවන් සඳහා විනෝද ක්‍රීඩා පහසුකම් සහ වෙනත් සැප පහසුකම් සැලැස්වීම ;

(ඈ) සිරකරුවන්ට තෑගි දීම ;

(ඉ) ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ සිරකරුවන් සඳහා ආපන ශාලා පවත්වාගෙන යාම පිණිස, ආපසු ගෙවිය හැකි අත්තිකාරම් ගෙවීම.

(ඊ) →

මුදල් වර්ෂය.

6. අරමුදලේ කාර්යයන් සඳහා වූ මුදල් වර්ෂය ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ ව දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය වන්නේ ය.

ගණන් සහ විගණනය.

7. (1) අරමුදලේ ගණන් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය.

(2) එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අරමුදලේ කටයුතු සිදු වූ ආකාරය දක්වන්නා වූ ද අරමුදලේ කටයුතුවලට සම්බන්ධ සියලු ගණුදෙනුවල පූර්ණ විස්තර අඩංගු වූ ද පූර්ණ ප්‍රකාශයක් බන්ධනාගාර කොමසාරිස්වරයා විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ද සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් හැකි පහසු ඉක්මණින් එකී වාර්තාව ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

අර්ථ නිරූපණය.

8. [illegible] "ලේකම්" යන්නෙන් බන්ධනාගාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ.



ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1979 අංක 54 දරන
බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ
සිරකරු ගුණ සාධක අරමුදල් (සංශෝධන) පනත

[සභානිකය සමඟ කලේ 1979 අගෝස්තු මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 සැප්තැම්බර් 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 20 යි

තැපැල් ගාස්තුව : ශත 25 යි

1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් (සංශෝධන) පනත

[සභානීකය සටහන් කළේ 1979 අගෝස්තු මස 30 වන දින.]

එල්. ඩී.—ඕ. 79/75.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 54 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — පුකුළු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනතෙහි 4 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිනිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන පනතෙහි 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අආ) සිරකරුවන්ගේ වේතන සහ පුද්ගලික මුදල් හිඟුම් වූ පොදු තැන්පතුවෙහි යම් සිරකරුවකුගේ බැරට ඇත්තා වූ මුදල්වලින්, ඒ සිරකරු මුදා හරිනු ලැබූ දිනයේ සිට වර්ෂයකට නොඅඩු කාලයක් තුළ හිමිකම් පානු නොලැබ නිබෙන්නා වූ යම් මුදලක්;".

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එම වගන්තිය අවසානයේ ඇති නැවතිමේ ලකුණ වෙනුවට තිත් කොමාවක් ආදේශ කිරීමෙන්; සහ

(ii) එම වගන්තිය අගට පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) සිරකරුවන් බන්ධනාගාරයෙන් නිදහස් කරනු ලැබීමෙන් පසුව ඔවුන්ගේ පුනරුත්ථාපනයෙහි ලා උපකාරී වන පශ්චාත් භාර සේවා.".

අ 42841—11,600 (79/07)

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ අවසාන ගිණුම - 2022
2022.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

විස්තරය	සටහන්	2022 වර්ෂය	2021 වර්ෂය
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
උපචිත ආදායම්			376.00
සිර ශ්‍රමය සැපයීමෙන් ලැබිය යුතු මුදල්		7,460	15,860
ආපසු අය කර ගත යුතු අත්තිකාරම්		1,880	1,880
2022.12.31 දිනට 6/28 අරමුදලේ ශේෂය		5,299,068	4,527,464
		5,308,408	**4,545,580**
ජංගම නොවන වත්කම්		-	
මුළු වත්කම්		**5,308,408**	**4,545,580**
බැරකම්			
ජංගම බැරකම්		-	-
ජංගම නොවන බැරකම්		-	-
මුළු බැරකම්		-	-
ශුද්ධ වත්කම්		-	-
ශුද්ධ වත්කම් / ස්කන්ධය		-	-
සංචිත		-	-
ඉදිරියට ගෙනා ශේෂය		4,545,580	3,636,750
2022වර්ෂයේ අතිරික්තය		758,638	908,830
අවිනිශ්චිත ගිණුම		4,190	-
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		**5,308,408**	**4,545,580**

සකස් කළේ :
නම - එස්.කේ. ඉනෝකා ලක්මිණී
තනතුර - කළමනාකරණ සේවා නිළධාරී
දිනය - 23-02-2023

පරීක්ෂා කළේ :
නම -එස්.ඩී.එන්.සී. දිල්රුක්ෂි
තනතුර - කළමනාකරණ සේවා නිළධාරී
දිනය - 2023-02-23

ඉහත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව සකස් කර ඇත.
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිරකරු සුබසාධක අරමුදලේ අතිරික්තය හා 2022.12.31 දිනට එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්වයන් ඉහත මූල්‍ය ප්‍රකාශන වල පවතින බව සහතික කරමි.

ගණකාධිකාරී
නම - එච්.ඒ.සී.පී.ධර්මරත්න
තනතුර - නියෝජ්‍ය කොමසාරිස් (මුදල්)
දිනය - 2023-02-23

එච්.ඒ.සී.පී. ධර්මරත්න
නියෝජ්‍ය කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

ප්‍රධාන ගණකාධිකාරී
නම -ආර්.එම්.එන්.කේ.කේ. අබේරත්න
තනතුර - බන්ධනාගාර කොමසාරිස් (මුදල්)
දිනය - 2023-02-23

ආර්.එම්.එන්.කේ.කේ. අබේරත්න
බන්ධනාගාර කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව අරමුදලේ පාලනය හා කළමනාකරණයේ වගකීම මා වෙත පැවරී ඇත. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන හා අදාළ ලේඛණ අනුමත කරමි.

ගණන්දීමේ නිලධාරි
නම - එච්.එම්.ටී.එන් උපුල්දෙණිය
තනතුර - බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
(අරමුදලේ පරිපාලක)
දිනය -

එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම -
තනතුර -
දිනය -

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.
2023.02.27

ගිණුම් කටයුතු පිළිබඳ හෙළිදරව් කිරීම්

01. මෙම අරමුදල පහත සඳහන් නීතීමය විධිවිධාන අනුව ක්‍රියාත්මක වේ.

(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදල් පනත

(ii) 1976 අප්‍රේල් මස 27 දිනැති සිරකරු සුබසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත

02. සිරකරු සුබසාධක අරමුදල මූලස්ථානය ඇතුළු ප්‍රාදේශීය බන්ධනාගාර 29 ක ක්‍රියාත්මක වේ.එම සියළුම බන්ධනාගාර ආයතන වල ගිණුම් ප්‍රකාශන සැසඳුම් වාර්තා ලබාගෙන අරමුදලේ භාණ්ඩාගාර ශේෂය සමඟ සැසඳීම් සිදුකර සිරකරු සුබසාධක අරමුදල් පනතේ 07(2) ඡේදය අනුව 2022 වර්ෂය අවසන් වීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත.

03. 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි 10 වන ඡේදය අනුව සිරකරු සුබසාධක අරමුදල සඳහා විශේෂයෙන් බැංකු ගිණුමක් පවත්වා ගනු නොලබන අතර දෙපාර්තමේන්තු නිළ බැංකු ගිණුම මගින් ගනුදෙනු සිදුකර ඇත.

04. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිරකරු සුබසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2013-3 හා 2013.10.02 දිනැති චක්‍රලේඛ අංක 03/2013 අනුව සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුවපිළියෙළ කර ඇත.

05. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත 01 හි වගන්ති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල අඟයන් ඉදිරිපත් කිරීමේදී වඩාත් තේරුම්ගත හැකි බවට පත්කිරීම සඳහා රුපියල් වටිනාකමට අනුව මූල්‍ය ප්‍රකාශන වල අඟයන් ඉදිරිපත් කර ඇත.

06. සිරකරු සුබසාධක අරමුදලේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේ ගිණුම් වර්ෂය ඒ ඒ වර්ෂයේ ජනවාරි 01 ආරම්භ වී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වේ.

07. සිරකරු සුබසාධක අරමුදල් පනතේ විධිවිධාන අනුව ප්‍රතිපාදන සලසා ඇති පහත දැක්වෙන ආදායම් ශීර්ෂ ගණයට ඇතුලත් වන ආදායම් පමණක් සිරකරු සුබසාධක අරමුදලේ ආදායම් ලෙස රැස්කර ඇත.

I. විනෝද භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ශුද්ධ ආදායමෙන් කොටස

II. සිර වේතන වලින් කරනු ලබන අනිවාර්ය අයකිරීම්

III. මහජන මුදල් පරිත්‍යාග

IV. සිර ශ්‍රමය සැපයීමෙන් වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වලින් අය කරන මුදල්

V. සිරකරුවන් වෙත තිබූ නීති විරෝධී මුදල් ලැබීම්

VI. බන්ධනාගාර භූමියෙහි තිබී අසු වූ අයිතිකරුවෙකු නොමැති මුදල්

VII. වෙළඳසැල් වලින්, ප්‍රදර්ශන වලින් , ආපනශාලා වලින් ලැබෙන ශුද්ධ ලාභ

VIII. හිමිකම් නොපෑ තිබෙන්නා වූ මුදල්

IX. වෙනත් දායක මුදල් ලැබීම්

X . නීති විරෝධී ලෙස සිරකරුවන් ලඟ තිබී හසුවූ මුදල්

08. සිරකරු සුබසාධක අරමුදලේ කටයුතු පවත්වාගෙන යාම සඳහා රජයේ දායකත්වයක් මෙතෙක් ලබාගෙන නොමැත. එහි ආදායම්ද ඉතා අවිනිශ්චිත වූ රැස්කිරීම් වලින් සමන්විත වේ. එම නිසා වර්ෂය සඳහා ඇස්තමේන්තු මගින් වියදම් කිරීමට අපේක්ෂිත සිරකරුවන්ගේ සුබසාධනය සඳහා වූ වැඩසටහන්, අනුග්‍රාහකත්වය දක්වන සිරකරු සුබසාධක අරමුදල් මඩි සංගමය, සිරකරු සුබසාධක අරමුදල් උප කමිටු, රාජ්‍ය නොවන සංවිධාන, රතු කුරුස සංවිධානය හා වෙනත් ස්වේච්ඡා සංවිධාන වැනි ආයතන වල අනුග්‍රාහකත්වයෙන් සිදු කරන ලදී.

09. සිරකරු සුබසාධක අරමුදලෙහි ලැබීම් ශීර්ෂයන් අනුව එක් එක් බන්ධනාගාර උප ආයතනයන්හි ලැබීම් පිටු අංක 16 මගින් ඉදිරිපත් කර ඇත.

10. සිරකරු සුබසාධක අරමුදලෙහි මෙතෙක් පැවති වත්කම් 2020 වර්ෂයේ සිට විසර්ජන ගිණුම මගින් වාර්තා කිරීමට කටයුතු කර ඇත. මධ්‍යම රජය, බන්ධනාගාර කර්මාන්ත අංශය හා සිරකරු සුභ සාධක අංශය යන සියලු ගිණුම් මගින් පෙන්වා ඇති වත්කම් බන්ධනාගාර ආයතන තුල පවතින අතර එම සියලු වත්කම් විසර්ජන ගිණුම මඟින් වාර්තා කර ඇත.

දිනය :

බන්ධනාගාර කොමසාරිස් (මුදල්)

ආර්.එම්.එන්.කේ.කේ. අබේරත්න
බන්ධනාගාර කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ අවසාන ගිණුම - 2022

2022.12.31 න් අවසන් වර්ෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (ආදායම් වියදම් ගිණුම)

	2022 වර්ෂය රු.	**2021** වර්ෂය රු.
අයභාරය		
01.වෙළඳසැල් වලින් ලද දායක මුදල්	-	-
02.ප්‍රදර්ශන වලින් ලද දායක මුදල්	47,620	-
03.සිර චේතන වලින් කරනු ලබන අනිවාර්ය අඩු කිරීම්	59,074	105,357
04.සිර ශ්‍රමයට වෙනත් දෙපාර්තමේන්තු වලින් කරන අය කිරීම්	1,300,480	547,327
05.හිමිකම් පා නොමැති මුදල්	1,157,395	110,681
06.බන්ධනාගාර භූමියේ තිබූ අයිතිකරුවෙකු නොමැති බව ඔප්පු වූ මුදල්	14,460	26,944
07.වෙනත් දායක මුදල්	1,000	12,500
08.නීති විරෝධී ලෙස සිරකරුවන් ලග තිබී හසුවූ මුදල්	62,271	106,020
09.විනෝද භාණ්ඩ විකිණීමෙන් ලද ශුද්ධ ආදායමෙන් 1/6 ක කොටස	720	
මුළු අයභාරය	**2,643,020**	**908,830**
වියදම්		
01.සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික වියදම්	518,996	-
02.සිරකරුවන්ගේ අධ්‍යාපනික හා සුභසාධන වියදම්	509,345	-
03.සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් වියදම්	506,103	-
04.සිරකරුවන්ගේ ත්‍යාග දීමේ වියදම්	281,898	-
05.පශ්චාත්භාර සේවා වියදම්	63,850	-
06.අවිනිශ්චිත ගිණුම	4,190	
මුළු වියදම	**1,884,382**	
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	**758,638**	**908,830**

සකස් කළේ :

පරීක්ෂා කළේ :

එච්.ඒ.සී.පී. ධර්මරත්න
නියෝජ්‍ය කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

බන්ධනාගාර කොමසාරිස් (මුදල්)

ආර්.එම්.එන්.කේ.කේ. අබේරත්න
බන්ධනාගාර කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
(අරමුදලේ පරිපාලක)

එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ අවසන් ගිණුම - 2022

2022.12.31 න් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම

	2022 වර්ෂය රු.	**2021** වර්ෂය රු.
2022.01.01 දිනට ඉදිරියට ගෙනා ශේෂය	4,527,464	3,618,634
(+)		
01.වෙළඳසැල් වලින් ලද ආයක මුදල්	-	
02.ප්‍රදර්ශන වලින් ලද ආයක මුදල්	47,620	
03.සිර වේතන වලින් කරනු ලබන අනිවාර්ය අඩු කිරීම්	59,450	105,357
04.සිර ශ්‍රමයට වෙනත් දෙපාර්තමේන්තු වලින් කරන අය කිරීම්	1,308,880	547,327
05.හිමිකම් පා නොමැති මුදල්	1,157,395	110,681
06.බන්ධනාගාර භූමියේ තිබූ අයිතිකරුවෙකු නොමැති බව ඔප්පු වූ මුදල්	14,460	26,944
07.වෙනත් දායක මුදල්	1,000	12,500
08.නීති විරෝධී ලෙස සිරකරුවන් ලග තිබී හසුවූ මුදල්	62,271	106,020
09.විනෝද භාණ්ඩ විකිණීමෙන් ලද ශුද්ධ ආදායමෙන් 1/6 ක කොටස	720	-
(-)	2,651,796	4,527,464
01.සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික වියදම්		
ප්‍රාග්ධන	22,998	
පුනරාවර්තන	495,998	
02.සිරකරුවන්ගේ අධ්‍යාපනික හා සුභසාධන වියදම්		
ප්‍රාග්ධන	17,000	
පුනරාවර්තන	492,345	
03.සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් වියදම්		
ප්‍රාග්ධන	150,485	
පුනරාවර්තන	355,618	
04.සිරකරුවන්ගේ ත්‍යාග දීමේ වියදම්		
ප්‍රාග්ධන	23,000	
පුනරාවර්තන	258,898	
05.පශ්චාත්භාර සේවා වියදම්		
ප්‍රාග්ධන	-	
පුනරාවර්තන	63,850	
	1,880,192	
2022.12.31 දිනට ඉදිරියට ගෙන යන ශේෂය	**5,299,068**	**4,527,464**

සකස් කළේ :

පරීක්ෂා කළේ :

එච්.ඒ.සී.පී. ධර්මරත්න
නියෝජ්‍ය කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

බන්ධනාගාර කොමසාරිස් (මුදල්)

ආර්.එම්.එන්.කේ.කේ. අබේරත්න
බන්ධනාගාර කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

(අරමුදලේ පරිපාලක)

එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

සිරකරු සුබසාධක අරමුදල
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	2022	2021
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
ලැබීම්		
ප්‍රදර්ශනවලින් ලැබීම්	47,620	-
සිරකරුවන්ගේ වේතන වලින් කරනු ලබන අනිවාර්ය අය කිරීම් ගිණුම	59,450	105,357
සිර ශ්‍රමය සැපයීම වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තු වලින් මුදල් අය කිරීම්	1,308,880	547,327
හිමිකම් නොපෑ තිබෙන්නා වූ මුදල්	1,157,395	110,681
අයිතිකරුවෙකු නොමැති බව ඔප්පු වූ මුදල්	14,460	26,944
නීති විරෝධි ලෙස සිරකරුවන් ලග තබා හසුවූ මුදල්	62,271	106,020
වෙනත් දායක මුදල්	1,000	12,500
.විනෝද භාණ්ඩ විකිණීමෙන් ලද ශුද්ධ ආදායමෙන් 1/6 ක කොටස	720	-
	2,651,796	908,830
ගෙවීම්		
අධ්‍යාත්මික හා ආගමික වියදම් ගිණුම	518,996	-
සිරකරුවගේ සිරකරුවන්ගේ අධ්‍යාපනික හා සුභසාධන වියදම් ගිණුම	509,345	-
සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් වියදම් ගිණුම	506,103	-
සිරකරුවන්ට ලබා දෙන ත්‍යාග සඳහා වියදම් ගිණුම	281,898	-
සිරකරුවන්ගේ පශ්චාත්භාර සේවා කටයුතු වියදම් ගිණුම	63,850	-
	1,880,192	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	771,604	908,830
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්		
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		-
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / අඩුවීම	771,604	908,830
කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	4,527,464	3,618,634
කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ	**5,299,069**	**4,527,464**

සකස් කළේ :

පරීක්ෂා කළේ :

එච්.ඒ.සී.පී. ධර්මරත්න
නියෝජ්‍ය කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

බන්ධනාගාර කොමසාරිස් (මුදල්)

ආර්.එම්.එන්.කේ.කේ. අබේරත්න
බන්ධනාගාර කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

සිරකරු සුබසාධක අරමුදල

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය(සමුච්චිත අරමුදල)

		එකතුව
2022 ජනවාරි 01 දිනට ශේෂය	4,545,580	4,545,580
(+)2022සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධයෙහි වෙනස්වීම		
ශුද්ධ වත්කම් / ස්කන්ධයෙහි හඳුනා ගන්නා ලද ශුද්ධ අයහාරයෙහි වර්ධනය		
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය	758,638	758,638
2022.12.31 දිනට ශේෂය		**5,304,218**

සකස් කළේ :

පරීක්ෂා කළේ :

එච්.ජී.සී.පී. ධර්මරත්න
නියෝජ්‍ය කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.

බන්ධනාගාර කොමසාරිස් (මුදල්)

ආර්.එම්.එන්.කේ.කේ. අබේරත්න
බන්ධනාගාර කොමසාරිස් (මුදල්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.